ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යයනාංශය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන 2018/2019

අවසාන පරීක්ෂණය (පළමුවන කොටස) - 2019

**ESP2201/STP8501-** අධ්‍යාපන මනෝවිද්‍යාව

කාලය - පැය තුනයි.

---

දිනය -2020.01.25 වේලාව- පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී 'උපස්ථම්භන' භාවිතයේ වැදගත්කම අධ්‍යාපන මනෝවිද්‍යාත්මක න්‍යායක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න.

02. ප්‍රාථමික චිත්තවේග පහක් (05) දක්වා ඒවා ද්විතීයික චිත්තවේග ගොඩ නැගීමට සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න.

03. ළමයින්ගේ ප්‍රජානන සංවර්ධනයට චිත්තවේග බලපාන ආකාරය පැහැදිලි කරන්න.

04. පර්යේෂණාත්මක සහ පර්යේෂණාත්මක නොවන ළමා චර්යා අධ්‍යයන ක්‍රම අතර ඇති වෙනස්කම් දෙකක් (02) නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. සාර්ථක ඉගෙනීම තීරණය කිරීමේ දී බලපාන සාධක දෙකක් (02) සුදුසු උදාහරණ ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න.

06. (i) සමස්ත සංජානනය සුසාධ්‍ය කරන උත්තේජන සම්බන්ධ සාධක දෙකක් (02) සඳහන් කරන්න.

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී සිසුන් තුළ සමස්ත සංජානනය සුසාධ්‍ය කිරීම සඳහා ඔබ ඉහත සඳහන් කළ සාධක දෙකෙන් එකක් යොදා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

07. "වැඩිහිටියන් සපයන ආදර්ශ ළමුන්ගේ පෞරුෂ සංවර්ධනයට බලපාන වැදගත් සාධකයකි." මෙම ප්‍රකාශය විභාග කරන්න.

08. පුද්ගලයෙකුගේ ප්‍රජානන සංවර්ධනය පැහැදිලි කිරීම සඳහා බෲනර් ඉදිරිපත් කළ ප්‍රධාන සිද්ධාන්ත දෙක (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරුවරයෙකු සපුරාලිය යුතු භූමිකාවන් පහක් (05) දක්වන්න. (ලකුණු 05)

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ඔබ සංවිධානය කළ ඉගෙනුම් අත්දැකීම්වල සිසුන්ගේ සාධනය කෙරෙහි ඇති බලපෑම ( ප්‍රබලතා/දුබලතා) අධ්‍යයනය කිරීමට ඔබට අවශ්‍යව ඇතැයි උපකල්පනය කරන්න.

(අ) ඉහත කාර්යය සඳහා ඔබ තෝරා ගන්නා ළමා චර්යා අධ්‍යයන ක්‍රමය/ක්‍රම සඳහන් කරන්න. (ලකුණු 03)

(ආ) ඔබගේ තේරීම සඳහා හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) තෝරාගත් ක්‍රම දෙකින් විශ්වාසදායී හා වලංගු තොරතුරු රැස්කර ගැනීමට ඔබ යොදා ගන්නා ක්‍රියාමාර්ග දෙක (02) බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

10. (i) 'සමබර පෞරුෂය' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 04)

(ii) ළමයින් තුළ සමබර පෞරුෂයන් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලාංකික සන්දර්භයට අදාළ උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පෞරුෂ න්‍යායකට අදාලව ළමුන් තුළ සමබර පෞරුෂ සංවර්ධනය සුසාධ්‍ය කිරීමට ගුරුවරයෙකුට භාවිත කළ හැකි ක්‍රියාමාර්ග හතරක් **(04)** පැහැදිලි කරන්න.

(ලකුණු 08)

11\. (i) පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායයේ මූලික මූලධර්ම සහ විගොට්ස්කිගේ ප්‍රජානන සංවර්ධන න්‍යායයේ මූලික මූලධර්ම හඳුන්වා ඒවා අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) විගොට්ස්කිගේ න්‍යායට අදාලව ළමුන්ගේ ප්‍රජානන සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා ගුරුවරයෙකුට භාවිත කළ හැකි උපාය මාර්ග හතරක් **(04)** විස්තර කරන්න.

(ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ ක්‍රියාමාර්ග යොදා ගැනීමේදි ගුරුවරයෙකුට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග තුනක් **(03)** සහ ඒවා සාර්ථක ලෙස ජය ගැනීමට ඔබගේ යෝජනා පැහැදිලි කරන්න. (ලකුණු 08)

12\. (i) බෲනර්ගේ ඉගෙනුම පිළිබඳ න්‍යායයෙහි (අනාවරණ ඉගෙනුම) මූලධර්මවලට අනුව පුද්ගලයෙකු තුළ ඉගෙනුම සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) "ගුරුවරයෙකුට අනාවරණ ඉගෙනුමෙහි මූලධර්ම ප්‍රාථමික ශ්‍රේණිවල මෙන්ම ද්විතීයික ශ්‍රේණිවල සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේදී යොදා ගත හැක." මෙම කියමන විභාග කර එය තහවුරු කිරීම සඳහා ඔබගේ අදහස් සුදුසු උදාහරණ සමඟ ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(iii) බෲනර්ගේ ඉගෙනුම පිළිබඳ න්‍යායයට අනුව ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී පන්ති කාමරය තුළ ගුරුවරයෙකුට මුහුණ දීමට සිදුවන ගැටලු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

13. ළමුන්ගේ වර්ධනය හා සංවර්ධනය සුසාධ්‍යකරණය කිරීමේ දී දෙමාපියන්ගේ භූමිකාව පිළිබඳව ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කිරීමේ කාර්යය ඔබට පැවරී ඇතැයි සිතන්න.

(i) වර්ධනය සහ සංවර්ධනය අතර වෙනස සුදුසු උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) ළමාවියේ පසුවන දරුවන්ගේ වර්ධනය සහ සංවර්ධනය පිළිබඳව දෙමාපියන්ගේ අවධානය යොමු කරවීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ළමුන්ගේ සංවර්ධනය සුසාධ්‍ය කිරීමේ දී දෙමාපියන්ගේ භූමිකාව පිළිබඳ ඔබගේ ඉදිරිපත් කිරීමේ ඔබ ඇතුළත් කරන ප්‍රධාන කරුණු හා උදාහරණ පහත අංශ යටතේ පැහැදිලි කරන්න.

(අ) කායික සංවර්ධනය
(ආ) ප්‍රජානන සංවර්ධනය
(ඇ) චිත්තවේගීය සංවර්ධනය
(ඈ) සමාජයීය සංවර්ධනය
(ඉ) සදාචාරාත්මක සංවර්ධනය

(එක් අංශයක් සඳහා කරුණු දෙකක්) (ලකුණු 12)

14. (i) වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළ ජීවත්වන නවයෞවනයන්ගේ චිත්තවේග සංවර්ධනය පිළිබඳව වැඩිහිටියන්ගේ දැඩි අවධානය යොමු විය යුත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න. (හේතු තුනක් **(03)** උදාහරණ සමඟ දක්වන්න.) (ලකුණු 06)

(ii) පාසල් යන නවයෞවනයින් තුළ යහපත් චිත්තවේග සංවර්ධනය කිරීමට සමවයස් කණ්ඩායම්වල සහාය ගුරුවරයෙකුට යොදාගත හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) නවයෞවනයන්ගේ චිත්තවේග සංවර්ධනය සුසාධ්‍ය කිරීමේ දී දෙමාපියන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.